DOI : 10.31357/fhssmst.2015.00676

# ශ්‍රී ජයවර්ධනපුර නව නගරයේ උපනාගරික වාණිජ න්‍යෂ්ටි වර්ධනය

බරනන්දු බද්දෙලාගේ සුනීතා කෝට්ටගොඩ

**GS/SS/26/96**

16 NOV 2015

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය සඳහා
භූගෝල විද්‍යා විෂය යටතේ ඉදිරිපත් කරනු ලබන ස්වාධීන නිබන්ධය

**<u>අපේක්ෂකයාගේ ප්‍රකාශය</u>**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධිය සඳහා මා විසින් ඉදිරිපත් කරනු ලබන මෙම ස්වාධීන නිබන්ධය ආචාර්ය ගරු පින්නවල සංඝසුමන හිමියන්ගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරනු ලැබූ බවත්, මෙම පර්යේෂණ කෘතිය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ වෙනත් උසස් අධ්‍යාපන ආයතනයකට හෝ වෙනත් පශ්චාත් උපාධියක්/ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

දිනය 2015/11/11 ................................ Suneetha

අත්සන

**<u>සුපරීක්ෂකගේ නිර්දේශය</u>**

මෙම අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, 2015-09-25 දින වාචික පරීක්ෂණයේ දී පරීක්ෂණ මණ්ඩලය විසින් පෙන්වා දී ඇති සංශෝධන මාගේ සුපරීක්ෂණය යටතේ නිවැරදි කර ඇති බවත්, මෙම පරීක්ෂණ නිබන්ධය ශාස්ත්‍රපති උපාධිය ලබා දීම සඳහා සුදුසු බවත් නිර්දේශ කරමි.

දිනය 2015.11.11 ------------------------------------------

ආචාර්ය ගරු පින්නවල සංඝසුමන හිමි (උපදේශක)

භූගෝල විද්‍යා අධ්‍යයනාංශය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල - නුගේගොඩ

## පටුන

පිටු අංක


| | |
|---|---|
| අපේක්ෂකයාගේ ප්‍රකාශනය | |
| සුපරීක්ෂකගේ නිර්දේශය | |
| පටුන | i |
| වගු | iii |
| රූප සටහන් | iv |
| සිතියම් | v |
| ප්‍රස්තාර | vi |
| ස්තුතිය | vii |
| නිබන්ධ සාරාංශය | viii |

**පළමු පරිච්ඡේදය - හැඳින්වීම**

| | |
|---|---|
| 1.1 අධ්‍යයනයේ පසුබිම | 1 |
| 1.2 පර්යේෂණ ගැටලුව | 6 |
| 1.3 පර්යේෂණයේ අරමුණු | 7 |
| 1.4 ක්‍රමවේදය | 7 |
| 1.4.1 උපකල්පනය | 7 |
| 1.4.2 අධ්‍යයන ප්‍රදේශය | 7 |
| 1.4.3 නියැදිය | 9 |
| 1.4.4 දත්ත රැස්කිරීම | 9 |
| 1.4.5 දත්ත විශ්ලේෂණය | 11 |
| 1.5 ක්‍රමවේදය ආශ්‍රිත ගැටලු සහ සීමාවන් | 12 |

**දෙවන පරිච්ඡේදය - පුරවරකරණය සහ වාණිජ කාර්යයන්හි ව්‍යාප්තිය**

| | |
|---|---|
| 2.1 පුරවර නිර්වචනය කිරීම | 14 |
| 2.2 ලෝකයේ නාගරික පුරවර නිර්මාණයවීමට බලපා ඇති සාධක | 15 |
| 2.3 පුරවරතුල නව නගර නිර්මාණය | 22 |
| 2.4 නගර තුළ වාණිජ කාර්යයන්ගේ ව්‍යාප්තිය | 27 |

**තෙවන පරිච්ඡේදය - කොළඹ පුරවරයේ වර්ධන ප්‍රවණතා**


| | |
|---|---|
| 3.1 කොළඹ පුරවරය හැඳින්වීම | 40 |
| 3.2 ශ්‍රී ලංකාවේ නාගරික ධූරාවලියේ කාලීන වෙනස්වීම් | 41 |
| 3.3 කොළඹ උපනගර වර්ධනය වීම | 43 |
| 3.4 ශ්‍රී ජයවර්ධනපුර පරිපාලන අගනුවර | 45 |
| 3.5 ශ්‍රී ජයවර්ධනපුර නව නගරය ආශ්‍රිත වාණිජ න්‍යෂ්ටි වර්ධනය | 47 |


**සිව්වන පරිච්ඡේදය - ශ්‍රී ජයවර්ධනපුර නව නගරයේ වර්ධනය**
**වන වාණිජ න්‍යෂ්ටි හා ඒවායේ ගති ලක්ෂණ**


| | |
|---|---|
| 4.1 වාණිජ න්‍යෂ්ටිවල වර්ධනය | 51 |
| 4.1.1 බත්තරමුල්ල උපනාගරික න්‍යෂ්ටිය | 56 |
| 4.1.2 ජන සංඛ්‍යා වර්ධනය | 59 |
| 4.2 වර්තමාන භූමිපරිභෝග රටාව කෙරෙහි බලපා ඇති සාධක | 65 |
| 4.3 බත්තරමුල්ල උපනාගරික න්‍යෂ්ටියේ කාර්යයමය වර්ධනය | 72 |
| 4.4 මාලබේ උපනාගරික න්‍යෂ්ටියේ වර්ධනය | 79 |
| 4.5 පැලවත්ත උපනාගරික න්‍යෂ්ටියේ වර්ධනය | 91 |
| 4.6 බත්තරමුල්ල, පැලවත්ත, මාලබේ උපනාගරික න්‍යෂ්ටි වල වර්ධනයේ සංසන්දනාත්මක ඇගයීම සහ ඒ ආශිත ගැටලු | 104 |


**පස්වන පරිච්ඡේදය - නිගමන හා යෝජනා**


| | |
|---|---|
| 5.1 නිගමන | 109 |
| 5.2 යෝජනා | 111 |
| ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය | 113 |
| ඇමුණුම-ප්‍රශ්නාවලිය | 116 |

වගු


| | | |
|---|---|---|
| 3.1 | කොළඹ සහ පැරණි උපනගරතුළ ජනසංඛ්‍යා වර්ධනය 1981-2001 සහ 2012 | 44 |
| 4.1 | බත්තරමුල්ල ජන ඝණත්වය හා මිනිස් භූමි අනුපාතය 1997 | 61 |
| 4.2 | බත්තරමුල්ල ජන සංඛ්‍යාව 2001-2012 | 62 |
| 4.3 | බත්තරමුල්ල නිවාස ඝණත්වය 1999-2012 | 64 |
| 4.4 | බත්තරමුල්ල භූමි පරිභෝගය 1982 | 66 |
| 4.5 | භූමි පරිභෝග රටාව බත්තරමුල්ල -2001-2004-2012 | 69 |
| 4.6 | බත්තරමුල්ල විවිධ සේවාවන්හි කොළඹ දිස්ත්‍රික්කය තුළ ලැබෙන ස්ථානය | 75 |
| 4.7 | බත්තරමුල්ල ප්‍රදේශයේ වාණිජ කටයුතු සහ සේවාවන්ගේ වර්ධනය 1999-2001-2014 | 76 |
| 4.8 | බත්තරමුල්ල ප්‍රදේශයේ නිෂ්පාදන කර්මාන්ත සහ පරිපාලන කටයුතු වර්ධනය 1999-2001-2012 | 77 |
| 4.9 | මාලබේ ජන සංඛ්‍යා ව්‍යාප්තිය-2001-2012 | 80 |
| 4.10 | මාලබේ ප්‍රදේශයේ වාණිජ සේවා කටයුතු වර්ධනය 1999-2001 සහ 2014 | 87 |
| 4.11 | මාලබේ ප්‍රදේශයේ කර්මාන්ත සහ පරිපාලන කටයුතු වර්ධනය 1999-2001 සහ 2014 | 88 |
| 4.12 | පැලවත්ත ජනසංඛ්‍යාව සහ ජන ඝනත්වය 1997-2001 සහ 2012 | 93 |
| 4.13 | පැලවත්ත නිවාස ඝණත්වය | 94 |
| 4.14 | පැලවත්ත වාණිජ න්‍යෂ්ටියේ කාර්යයමය වර්ධනය 1999-2014 | 97 |
| 4.15 | පැලවත්ත 1999-2001 සහ2014 කර්මාන්ත හා පරිපාලන කටයුතු වර්ධනය. | 98 |

## රූප සටහන්

| | | |
|---|---|---|
| 2.1 | බර්ගස්ගේ ඒක කේන්ද්‍රීය ආදර්ශය. | 28 |
| 2.2 | හෝමෝ හොයිට්ගේ කලාපීය ආදර්ශය. | 29 |
| 2.3 | උල්මන් සහ හැරිස්ගේ බහු න්‍යෂ්ටි ආදර්ශය. | 30 |

**සිතියම්**


| | | |
|---|---|---|
| 1.1 | කොළඹ පුරවරයේ ව්‍යුහගත සැලැස්ම | 5 |
| 1.2 | අධ්‍යයන ප්‍රදේශය | 8 |
| 4.1 | නාගරික ධූරාවලිය අනුව වාණිජ න්‍යෂ්ටි පිහිටීම. | 52 |
| 4.2 | ග්‍රාම නිලධාරී වසම් අනුව ජන සංඛ්‍යාව -2012 | 55 |
| 4.3 | බත්තරමුල්ල , පැලවත්ත, මාලබේ භූමි පරිභෝග රටාව (1:50000 සිතියම) | 56 |
| 4.4 | භූමි පරිභෝග රටාව බත්තරමුල්ල (ගුගල් ඡයාරූපය-2014) | 58 |
| 4.5 | භූමි පරිභෝග රටාව බත්තරමුල්ල - 1999 | 69 |
| 4.6 | භූමි පරිභෝග රටාව බත්තරමුල්ල - 2004 | 70 |
| 4.7 | භූමි පරිභෝග රටාව බත්තරමුල්ල - 2012 | 71 |
| 4.8 | මාලබේ භූමි පරිභෝග රටාව (ගුගල් ඡයාරූපය-2014) | 83 |
| 4.9 | මාලබේ භූමි පරිභෝග රටාව -1999 | 85 |
| 4.10 | මාලබේ භූමි පරිභෝග රටාව-2004 | 85 |
| 4.11 | මාලබේ භූමි පරිභෝග රටාව-2012 | 86 |
| 4.12 | පැලවත්ත භූමිපරිභෝග රටාව -(ගුගල් ඡයාරූපය-2014) | 92 |
| 4.13 | පැලවත්ත භූමි පරිභෝග රටාව -1999 | 95 |
| 4.14 | පැලවත්ත භූමි පරිභෝග රටාව- 2004 | 96 |
| 4.15 | පැලවත්ත භූමි පරිභෝග රටාව-2012 | 96 |
| 4.16 | කොළඹ පුරවරයේ යෝජිත වාණිජ කලාපය | 102 |
| 4.17 | කොළඹ පුරවරයේ යෝජිත ප්‍රධාන කාර්මික කලාප | 103 |

**ප්‍රස්තාර**


| | | |
|---|---|---|
| 4.1 | ප්‍රස්තාරය - බත්තරමුල්ල ජන සංඛ්‍යාව (1963 - 2010) | 60 |
| 4.2.1 | ප්‍රස්තාර - බත්තරමුල්ල නාගරික න්‍යෂ්ටිය තුළ වාණිජ කටයුතු සහ සේවාවන්ගේ විවිධත්වය-1999 | 78 |
| 4.2.2 | ප්‍රස්තාර- බත්තරමුල්ල නාගරික න්‍යෂ්ටිය තුළ වාණිජ කටයුතු සහ සේවාවන්ගේ විවිධත්වය-2001 | 78 |
| 4.2.3 | ප්‍රස්තාර- බත්තරමුල්ල නාගරික න්‍යෂ්ටිය තුළ වාණිජ කටයුතු සහ සේවාවන්ගේ වර්ධනය - 2014 ) | 79 |
| 4.3 | ප්‍රස්තාරය - ස්ත්‍රී පුරුෂ භාවය අනුව ජන සංඛ්‍යාව 2012 | 81 |
| 4.4.1 | ප්‍රස්තාරය මාලබේ නාගරික න්‍යෂ්ටිය තුළ වාණිජ කටයුතු සහ සේවාවන්ගේ විවිධත්වය-1999 | 88 |
| 4.4.2 | ප්‍රස්තාරය මාලබේනාගරික න්‍යෂ්ටිය තුළ වාණිජ කටයුතු සහ සේවාවන්ගේ විවිධත්වය -2001 | 89 |
| 4.4.3 | ප්‍රස්තාරය මාලබේ නාගරික න්‍යෂ්ටිය තුළ වාණිජ කටයුතු සහ සේවාවන්ගේ විවිධත්වය 2014 | 89 |
| 4.5.1 | ප්‍රස්තාරය පැලවත්ත නාගරික න්‍යෂ්ටිය තුළ වාණිජ කටයුතු සහ සේවාවන්ගේ විවිධත්වය- 1999 | 98 |
| 4.5.2 | ප්‍රස්තාරය පැලවත්ත නාගරික න්‍යෂ්ටිය තුළ වාණිජ කටයුතු සහ සේවාවන්ගේ විවිධත්වය -2001 | 99 |
| 4.5.3 | ප්‍රස්තාරය පැලවත්ත නාගරික න්‍යෂ්ටිය තුළ වාණිජ කටයුතු සහ සේවාවන්ගේ විවිධත්වය -2014 | 99 |

## ස්තුතිය

මෙම පශ්චාත් උපාධි නිබන්ධය කරගෙනයාම සඳහා මා හට උපදේශකත්වය ලබාදුන් ආචාර්ය ගරු පින්නවල සංඝසුමන ස්වාමීන්වහන්සේට ගෞරවනීය ස්තුතිය පළමුවෙන්ම පුදකරන අතර මෙම අධ්‍යයනය ආරම්භයේ දී උපදේශකත්වය ලබා දුන් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය වයි.ඒ.ඩී.එස්. වනසිංහ මහත්මියටත් ස්තුතිවන්ත වෙමි.

එලෙසම භූගෝල විද්‍යා අධ්‍යයනාංශයේ අධ්‍යයනාංශ ප්‍රධානතුමිය වන මහාචාර්ය සුනේත්‍රා තෙන්නකෝන් මහත්මියටත්, භූගෝල විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය ආර්.එම්.කේ. රත්නායක මහතා ඇතුලු ආචාර්ය මණ්ඩලයයේ සියලුම ගුරු භවතුන්ට ස්තුතිය පුද කරමි.

නිරතුරුව මා ධෛර්යමත් කරමින් මඟ පෙන්වා දුන් පශ්චාත් උපාධි පීඨයේ පීඨාධිපතිතුමිය වන ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ස්වර්ණා පියසිරි මහත්මියටත්, පශ්චාත් උපාධි පීඨයේ වැඩ බලන පීඨාධිපතිතුමිය වන මහාචාර්ය සාගරිකා ඒකනායක මහත්මියටත්, මහාචාර්ය කේ.එම්.ඊ.පී. ප්‍රනාන්දු මහත්මියටත්, මහාචාර්ය සඳුන් සෙනරත් මහත්මියටත්, මාගේ හෘදයාංගම ස්තුතිය පිරිනමමි.

මෙම අධ්‍යයනය සඳහා තොරතුරු ලබා ගැනිමේ දී සහය ලබාදුන් ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ නිළධාරීන් සැමට, නාගරික සංවර්ධන අධිකාරියේ සියලුම නිළධාරීන්ට, මොරටුව විශ්වවිද්‍යාලයේ නගර සැලසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යනාංශ ප්‍රධාන තුමා ඇතුලු සැමට, ස්තුතිවන්ත වෙමි.

එසේම ක්ෂේත්‍ර දත්ත ලබා ගැනිමේ දී සහය ලබා දුන් කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්තුමා ඇතුලු නිලධාරීන් සැමට, කඩුවෙල බත්තරමුල්ල ප්‍රාදේශීය සභාවල සභාපතිතුමන්ලා ඇතුලු සැමට, ග්‍රාම නිලධාරි මහතුන්ටද ස්තුති වන්ත වෙමි. එලෙසම අධ්‍යයන ප්‍රදේශයේ තොරතුරු ලබා ගැනීමේදී සහය ලබා දුන් වාණිජ ව්‍යාපාරික සැමටත්, පාරිභෝගික සහ නේවාසික ජනතාවටද ස්තුතිය පුද කරමි.

ආරම්භයේ සිටම මෙම අධ්‍යයනය කරගෙනයාමේ දී මා හට උපදෙස් ලබා දෙමින්, නිතරතුරුම මා දිරිමත් කළ මාගේ ආදරණීය ස්වාමිපුරුෂයාට, දියණිය සහ පුතණුවන්ට මාගේ හදපිරි ස්තුතිය පුද කරමි.

# ශ්‍රී ජයවර්ධනපුර නව නගරයේ උපනාගරික වාණිජ න්‍යෂ්ටි වර්ධනය

## නිබන්ධ සාරාංශය

මානව සමාජයේ විශේෂ අවධානයට ලක් වූ ක්‍රියාවලියක් වන නාගරිකරණය සමග සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල විවිධ වෙනස්කම් රාශියක් දැකගත හැකිය. නාගරීකරණ ක්‍රියාවලිය සමඟ නගරෝපාන්තකරණය හා පුරවරකරණය සිදුවේ. නගර මගින් නේවාසික, පරිපාලන, වාණිජ යන මූලික කාර්යයන් ඉටුකරනු ලබන අතර වාණිජ කාර්යයන් සඳහා වැදගත් ස්ථානයක් හිමිවේ. ශ්‍රී ලංකාවේ ද නාගරීකරණයේ ප්‍රතිඵලයක් ලෙස කොළඹ පුරවරය බිහිවී ඇත. මෙහිදී කොළඹ අවට උපනගර වර්ධනය වීමේ දී ආර්ථික, සමාජ ,දේශපාලන, තාක්ෂණික ආදි විවිධ සංස්ථාමය සාධක බලපා ඇත. ජනගහනය සිසු ලෙස වර්ධනය වීමත්, කාර්යයන් ඒකරාශී වීම සහ අධික ජනාකීර්ණ ප්‍රදේශයක් බවට පත්වීමත් නිසා පැල්පත් හා මුඩුක්කු බිහිවීම, ඉඩම් මිල ඉහළ යාම, වාහන තදබදය, පරිසර දූෂණය, ආදී ගැටලුවලට විසඳුමක් ලෙස පුරවරය තුළ පරිපාලන කටයුතු විකේන්ද්‍රණය කර නව පරිපාලන නගරයක් ඇති කිරීම සඳහා 1979 දී ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නව නගරය පිහිටුවන ලදි. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නව නගරය පිහිටුවීමෙන් පසු මෙම ප්‍රදේශය තුළ නේවාසික, වාණිජ, පරිපාලන කාර්යයන්වල වර්ධනයක් සහ විවිධත්වයක් ගනු ලැබීය. ඒ අනුව මෙම කලාපය තුළ පිහිටි ග්‍රාමීය සේවා මධ්‍යස්ථාන වාණිජ න්‍යෂ්ටි බවට පරිවර්තනය විය. මෙම අධ්‍යයනය තුළින් එවැනි වාණිජ න්‍යෂ්ටි තුනක් වන බත්තරමුල්ල, මාලබේ, පැලවත්ත පිළිබඳව සවිස්තරාත්මක විශ්ලේෂණයක් සිදුකරන ලදි. වසර 1982 සිට 2014 කාලයතුල මෙම න්‍යෂ්ටි තුනෙහි භූමි පරිභෝග රටාව සහ විශේෂයෙන් වාණිජ කාර්යයන් පිළිබඳ අධ්‍යයනයකට ලක්විය. නාගරික සහ වාණිජ කාර්යයන්වල වර්ධනයක් න්‍යෂ්ටි තුන තුළම සිදු වුවද විශේෂ ලක්ෂණයක් ලෙස එම කාර්යයන් මංසන්ධියෙන් පිටත ප්‍රදේශයට ප්‍රසාරණය වී ඇති බව දක්නට ලැබේ. මෙවැනි අධ්‍යයන තුළින් අනාගත නාගරික සැලසුම් සකස් කිරීමේ දී මේ පිළිබඳ සැලකිල්ලට භාජනය කර ගැනීම වැදගත් බව යෝජනා කරමි.

# පළමුවන පරිච්ඡේදය
# හැඳින්වීම

## 1.1 අධ්‍යයනයේ පසුබිම

නූතන සියවසේ මානව භූ දර්ශනයෙහි සිදුවෙමින් පවත්නා සීඝ්‍ර වෙනස්වීම් කෙරෙහි බලපා ඇති ප්‍රධාන සන්තතික ක්‍රියාවලියක් ලෙස නාගරීකරණය හැඳින්විය හැකිය. ලෝකයේ ප්‍රධාන සමාජ විපර්යාසයන් අතර මානව සමාජයේ විශේෂ අවධානයට ලක් වූ ක්‍රියාවලියක් ලෙස ද එය හැඳින්විය හැකිය.

නාගරීකරණ ක්‍රියාවලිය අධ්‍යයනය කිරීමට ප්‍රථමයෙන් නගර පිළිබඳවත්, එහි සුවිශේෂී ලක්ෂණ පිළිබඳවත් විමසා බැලීම වැදගත් වේ. නගර පිළිබඳව සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව, ඉතිහාසය, දේශපාලන විද්‍යාව යන විවිධ විෂය ක්ෂේත්‍රයන් යටතේ හදාරනු ලබන අතර භූගෝල විද්‍යා විෂය මගින් සුවිශේෂී අවධානයක් යොමු කර ඇත.

නගර පිළිබඳ හැදෑරීමේදී භූගෝල විද්‍යාඥයින් විවිධ නිර්වචන ඉදිරිපත් කර ඇත. P. විඩාල් ඩිලා බිලාච් (Phal, 1971) නගර හඳුන්වා ඇත්තේ ''ස්වභාව ධර්මයා විසින් අවශ්‍යතා සහ ආශාවන් තෘප්තිමත් කරලීම සඳහා සකස් කොට ඇති භූමිය මිනිසා විසින් යහපත් සේ පිළියෙළ කිරීමයි'' යනුවෙනි.

එසේම හැරල්ඩ් මේයර් ගේ අදහස අනුව නගරය යනු ජනාවාස නැමති තීරයේ එක් කොටසක් ලෙස නගරය ලෙස සලකන බවයි (Harold, 1964).

19 වන ශත වන විට රැට්සල් හඳුන්වාදී ඇත්තේ ''පොලෝ තලයේ විශාල ප්‍රදේශයක මාර්ග රටාවේ මැද පිහිටි සංතතික ලෙස විහිදී ඇති අධික ජන ඝනත්වයකින් යුතු හා මිනිසුන් ගොඩනැගිලි ඒකරාශී වී ඇති විවිධ කාර්යයන් සංකේන්ද්‍රණය වූ ප්‍රදේශය'' නගරය බවයි (Lawrence, 1974).

නගරයක ලක්ෂණ හඳුනාගැනීමේදී නගර තුළින් කරනු ලබන කාර්යයන් හා එහි ගතික, ලක්ෂණ පිළිබඳව අවධානය යොමු කර ඇත. වෝල්ටර් ක්‍රිස්ට්‍රාලර් විසින් ඉදිරිපත් කළ කේන්ද්‍රස්ථාන වාදය තුළින් K =3 වාණිජ මූලධර්මය, K =4 පරිවහන මූලධර්මය සහ K=7 පරිපාලන මූලධර්මය ලෙස ධූරාවලින් තුනක් යටතේ නගරයේ කාර්යයමය ප්‍රදේශය අධ්‍යයනය කර ඇත. සීමා සහිත තැනිතලාවක් වීම, සමාන ප්‍රවාහන පහසුකම් හා එක් ප්‍රවාහන මාධ්‍යයක් වීම, වැඩිවන වියදම සමාන ජන ව්‍යාප්තිය, භාණ්ඩ ලබා ගැනීමේ කේන්ද්‍රස්ථානයක් පැවතීම හා මිළදී හැකියාව යන උපකල්පනයන් මගින් නිරීක්ෂණය කළ ක්‍රිස්ට්‍රාලර් සේවා මධ්‍යස්ථාන හරහා සේවා ලබාගන්නා ප්‍රදේශය, අනුපූරක ප්‍රදේශය, පසුබිම් ප්‍රදේශය සහ බලපෑම් ප්‍රදේශය ලෙස නම් කර ඇත (රත්නායක, 2009).

එමෙන්ම විලියම් රෙයිලි විසින් 1931 දී ගුරුත්වාකර්ෂණ නියාමනය ඉදිරිපත් කර සිල්ලර භාණ්ඩ ලබා ගැනීමට පාරිභෝගිකයින් පැමිණෙන ප්‍රදේශය වෙන් කර හඳුනා ගන්නා ලදි. එසේම නගරයේ පවතින ක්‍රියාවලි සහ විවිධත්වය අවබෝධ කර ගැනීම සඳහා සරල ආදර්ශ කිහිපයක් ඇත.එනම් 1925 දී බර්ගස් විසින් ඉදිරිපත් කළ ඒක කේන්ද්‍රිය ආදර්ශය, 1940 දී හෝමර් හොයිට් ඉදිරිපත් කළ කලාපීය ආදර්ශය සහ උල්මන් හාරිස් ඉදිරිපත් කළ බහුන්‍යෂ්ටි ආදර්ශය වැනි ආදර්ශය තුළින් නගරය තුළ ඇති විශේෂ ලක්ෂණ හඳුනාගත හැකිය (Robert and Burgess, 1967).

එසේම නගර සහ නගරවල සුවිශේෂ ලක්ෂණ හැදෑරීමේදී නාගරීකරණය ද ඉතාම වැදගත් සංරචකයකි. නාගරීකරණය පිළිබඳ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ නිර්වචනය අනුව නාගරීකරණය යනු "ග්‍රාමීය ප්‍රදේශවල සිට නගර කරා සිදුවන සංක්‍රමණය" ලෙසිනි.

එමෙන්ම ජන විකාශන විද්‍යාවට අනුව නාගරීකරණය යනු ''යම් කිසි රටක වෙසෙන මුළු ජන සංඛ්‍යාවෙන් නගරවල වෙසෙන ජනසංඛ්‍යාවේ ප්‍රමාණයයි'' බවයි (Loewenstein, 1971).

ලෝකයේ නාගරීකරණයේ ආරම්භක අවධිය ක්‍රි.ව. 1800 සිට වුව ද 19 සහ 20 වන ශතවර්ෂවලදී ඇති වූ කාර්මික විප්ලවය හේතුවෙන් බටහිර රටවල නාගරීකරණය වේගවත් විය. 1950 වසර තුළදී සංවර්ධිත රටවල නාගරීකරණ ප්‍රතිශතය 50% ක් වූ අතර එය 2014 වසර වන විට 73.4% ක් දක්වා වැඩි වී ඇත. නාගරීකරණය වේගය වර්ධනය වීමත් සමග පුරවරකරණය, නගරෝපාන්තකරණය වැනි ලක්‍ෂණ ද දක්නට ලැබේ.

ඉහත නිර්වචන මගින් පෙනී යන්නේ නාගරීකරණ ක්‍රියාවලියෙහි ප්‍රමුඛතම අවකාශය නගරය බවත් වාණිජ, කාර්මික, මූල්‍ය, අධ්‍යාපන, සෞඛ්‍ය, පරිපාලන සහ නේවාසික යනාදී විවිධ වූ කාර්යයන් ජාලයකින් එකිනෙකට සම්බන්ධ වූ ප්‍රදේශය නගරයක් ලෙස හඳුනාගෙන ඇති බවයි. නාගරීකරණය සමග නාගරික අවකාශය ප්‍රසාරණය වීමත්, නගරෝපාන්කරණය හා පුරවරකරණයත් සංවර්ධිත මෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල ද සිදුවේ. නගරෝපාන්තකරණය හා පුරවරකරණය සඳහා විවිධ සාධක බලපානු ලැබේ.

ව්‍යුහාත්මක හා කාර්යමය වශයෙන් ලෝකයේ නගර විවිධත්වයක් දක්වයි. බොහෝ නගර මගින් නේවාසික පරිපාලන වාණිජ යන කාර්යයන් ඉටුකරනු ලබන නමුත් ඒවා අතරින් වාණිජ කාර්යයන් සඳහා වැදගත් තැනක් හිමිවේ. මුල් අවධියේ නගරයක වාණිජ කාර්යයන් ප්‍රධාන වශයෙන් මධ්‍යම ව්‍යාපාර ප්‍රදේශයට පමණක් සීමා වී තිබූ අතර 19 වන සියවසේ මැද භාගය වන විට මධ්‍යම ව්‍යාපාර ප්‍රදේශයෙන් පිටතට වාණිජ කාර්යයන්හි ව්‍යාප්ත වීමක් දක්නට ලැබිණි. එසේ වාණිජ කාර්යයන් විකේන්ද්‍රණය වීමට සාධක රැසක් බලපානු ලැබේ. 1963 දී මේ පිළිබඳ පර්යේෂණයක් සිදු කළ බ්‍රයන් බෙරි (Berry, 1963) විසින් ආදර්ශයක් ඉදිරිපත් කරන ලදී. එහි පහත සඳහන් පරිදි වාණිජ ප්‍රදේශ 4 ක් හඳුනාගෙන ඇත.

01 මධ්‍ය ව්‍යාපාර ප්‍රදේශය

02 න්‍යෂ්ටි වශයෙන් වර්ධනය වූ ප්‍රදේශ

03 තීරු වශයෙන් පිහිටි කලාප

04 විශේෂිත කලාප ලෙසිනි.

මෙම ප්‍රදේශවලට ආවේණික හා සැලසුම් සහගත ලෙස ස්ථාපිත කරන ලද සේවාවන් පිළිබඳ එම ආදර්ශයෙන් පැහැදිලි කර ඇත. කොළඹ පුරවරය තුළ වාණිජ කාර්යයන් විකේන්ද්‍රණය වීමේදී විවිධ ලක්ෂණ ඇත. කොළඹ නගරයට පිටතින් පැරණි උප නගර කලාපය සහ නව උපනගර කලාපය ලෙස කලාප දෙකක් නිර්මාණය වී ඇති අතර මෙම උපනගරවල මාර්ග දෙපස තීරු ලෙස ස්ථාපිත වූ වාණිජ සේවාවන් සහ ප්‍රධාන මංසන්ධිවල කේන්ද්‍රණය වූ වාණිජ න්‍යෂ්ටි ද දක්නට ලැබේ. මෙම වාණිජ න්‍යෂ්ටි ඇති වීමේ දී රජයේ සැලසුම් පාදක වී ඇති බව පැහැදිලි වේ. වර්තමානය වන විට කොළඹ නගරයේ කාර්යයන් විකේන්ද්‍රණය වීමේ දී මධ්‍යම නගරය තුළ මූල්‍යමය කාර්යයන්, වාණිජ කාර්යයන් හා ප්‍රවාහන කාර්යයන් කේන්ද්‍රණය වී ඇත. ඊට අමතරව නගරයෙන් පිටත ප්‍රධාන කලාප 5 ක් ඔස්සේ කාර්මික නව නගර ඇති කිරීමත් අභ්‍යන්තර උපනාගරික කලාපයේ කුඩා ප්‍රධාන නගරය කේන්ද්‍ර කොටගෙන මාර්ග දැලිසක් සංවර්ධනය කිරීමත් , කොළඹ කටුනායක අධිවේගී මාර්ගය ඉදිකිරීම, පාරිසරික හා හරිත කලාපයන්ගෙන් සමන්විත විවෘත බිම් ඇති කිරීමත් අරමුණු වී ඇත. අංක 1.1 සිතියම මගින් මේ බව වඩාත් පැහැදිලි වේ.